**මයිකල් ආර්. පොම්පෙඕ රාජ්‍ය ලේකම්තුමා සහ ශ්‍රී ලංකාවේ විදේශ අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා විසින් පවත්වන ලද මාධ්‍ය හමුවකදී**

**මාධ්‍ය වෙත පළකළ අදහස්**

මයිකල් ආර්. පොම්පෙඕ රාජ්‍ය ලේකම්තුමා

කොළඹ, ශ්‍රී ලංකාව.

2020 ඔක්තෝබර් 28

**විදේශ අමාත්‍ය ගුණවර්ධන මහතා:** එක්සත් ජනපදයේ රාජ්‍ය ලේකම් ගරු මයික් පොම්පෙඕ මහතාණෙනි, (*නොපැහැදිලි ය*) රාජ්‍ය අමාත්‍යතුමනි, තානාපතිතුමියනි, ධූත මණ්ඩලයේ සාමාජික මහත්ම මහත්මියනි,

ලේකම්තුමනි, මුලින්ම මා උණුසුම් හා ප්‍රසන්න කාලගුණයක් ඇති (*නොපැහැදිලි ය*) ශ්‍රී ලංකාවට ඔබතුමාත් ඔබතුමාගේ ධූත පිරිසත් සාදරයෙන් පිළිගන්නවා.

හෙට දිනයේ, එනම් 2020 ඔතෝබර් මාසයේ 29වැනිදාට එකල සිලෝන් ලෙස හැඳින්වූ ශ්‍රී ලංකාවත් ඇමරිකා එක්සත් ජනපදයත් අතරේ රාජතාන්ත්‍රික සබඳතා ඇති කරගැනීමේ 72වැනි සංවත්සරය යෙදී තිබෙනවා. ඉතින්, එවැනි ඉතාමත් වැදගත් දිනයක (*නොපැහැදිලි ය*) රාජ්‍ය ලේකම්තුමා (*නොපැහැදිලි ය*) අප සමගින් එකතු වී සිටිනවා.

අවුරුදු 70 ඉක්මවන කාලයක් අප දෙරට ප්‍රජාතන්ත්‍රවාදය සහ සමාජ ආර්ථික (*නොපැහැදිලි ය*) යන පොදු වටිනාකම් මත පදනම් වූ ශක්තිමත් සම්බන්ධතාවයක් පෝෂණය කර තිබෙනවා. අපේ ජනතාව අතරේ තිබෙන සම්බන්ධතාවය (*නොපැහැදිලි ය*) තරම් ඈතට දිවෙනවා, රාජ්‍යතාන්ත්‍රික සබඳතා ඇතිකරගැනීමෙන් (*නොපැහැදිලි ය*)

ගෙවී ගිය මේ කාලය තුළ දේශපාලන, ආර්ථික, අධ්‍යාපන, සංස්කෘතික, නාවික කටයුතු ඇතුළු ආරක්ෂක ක්ෂේත්‍රය යනාදී ක්ෂේත්‍ර ආවරණය වන බහුවිධ මුහුණත් සහිත සබඳතා දක්වා අපගේ මේ සම්බන්ධවීම සැලකියයුතු අන්දමින් මුහුකුරා ගොස් තිබෙනවා. අප දෙරටේ ජනතාව අතරේ ඇතිවී තිබෙන අන්තර්ක්‍රියා මෙහිදී ඊටත් වඩා වැදගත් වනවා.

මෙවන් පසුබිමක් තුළ, එක්සත් ජනපදයේ මගේ සම මට්ටමේ සගයා වන ගරු මයිකම් පොම්පෙඕ මහතා උණුසුම් සහ හිතෛෂී අන්දමින් ශ්‍රී ලංකාවට පිළිගන්නේ ඉතාමත් සතුටින්. කෝවිඩ්-19 තත්වය සමගින් එල්ල වී ඇති බරපතල අභියෝගය පවා නොතකා ශ්‍රී ලංකාවට සංචාරය කිරීමත් ඔබතුමාගේ කාලය මේ වෙනුවෙන් වෙන්කොට ඔබතුමාගේ අදහස් අප සමගින් බෙදාහදාගැනීම සැබැවින්ම අපේ සිත් උණුසුම් කරනවා, ගරු මැතිතුමනි.

අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා සමගින් පුළුල් පරාසයක විෂයයන් ආවරණය කරමින් පැවැත්වූ සාකච්ඡාව ද, අප සිදුකළ සාකච්ඡාව ද තුළින්, මේ වසරේ ගතවූ මාසවලදී ඇමරිකානු පාර්ශවයේ ප්‍රධාන ධුර දරන්නන් සහ ශ්‍රී ලාංකික නායකයින් අතර ඇතිවූ සංවාදවලට අළුතින් ගැම්මක් ඇතිවූ බව කියන්නට පුළුවනි.

ලේකම්තුමනි, ඔබතුමා මෙසේ ශ්‍රී ලංකාවේ සංචාරය කරන්නේ අපගේ ජීවිත, ජීවනෝපාය සහ රටවල් අතරේ සම්බන්ධතා අන් කවරදාකවත් නොසිතූ මට්ටමකින් කෝවිඩ්-19 වසංගතයෙන් අභියෝගයට ලක්වී තිබෙන මොහොතකයි.

1930 ගණන්වලදී එක්සත් ජනපදයේ ජෝන්ස් හොප්කින්ස් විශ්වවිද්‍යාලය මහජන හා ප්‍රජා සෞඛ්‍ය ක්‍රමවේදයක් සංවර්ධනය සඳහා සිදුකළ අධ්‍යනයකින් (*නොපැහැදිලි ය*) ශ්‍රී ලංකාවේ සාර්ථක සෞඛ්‍යසේවා පද්ධතිය සඳහා දායක වූවා.

ලේකම්තුමනි, ආසියාවේ පැරණිතම ප්‍රජාතන්ත්‍රවාදය වන්නේ ශ්‍රී ලංකාවයි. අපි, වර්ෂ 90කට ආසන්න කාලයක් තිස්සේ සර්වජන ඡන්දබලය හිමිව තිබෙන පුරවැසියන් වනවා. වඩාත් ගතික කෝණයකින්

බැලුවහොත්, එය, ජනාධිපතිවරණය සහ මහ මැතිවරණය යන ප්‍රධාන ඡන්දය ප්‍රකාශ කිරීමේ ක්‍රියාවලි දෙකක් හරහා ශ්‍රී ලංකාවේ ජනතාව තමන්ගේ නිදහස් තේරීම පැහැදිලි ලෙස ප්‍රකාශ කළ, ප්‍රජාතන්ත්‍රවාදී වැයම් සහ පරිචයන් ඉතා ශක්තිමත් වූ කාලයක් වශයෙන් හඳුන්වන්නට පුළුවනි.

මේ මැතිවරණවලින් පිළිබිඹු වන්නේ ඒකීය රාජ්‍යයේ ස්වෛරීත්වය, භෞමික අඛණ්ඩතාවය, ජාතික ආරක්ෂාව සහ ආර්ථික ප්‍රගමනය ආරක්ෂා කිරීම සඳහා මහජනයා ලබාදෙන ජනවරම වන අතර ආර්ථික දියුණුව සාක්ෂාත් කරගනිමින් ස්ථාවර හා ආරක්ෂිත රටක් වශයෙන් අපේ ඉදිරිගමන සමගින් සම්බන්ධවීම සඳහා අපගේ සියළුම මිතුරු රටවල්වලට, විශේෂයෙන්ම එක්සත් ජනපදයට ඉන් පැහැදිලි අවස්ථාවක් ඉදිරිපත් කරනවා.

කෘෂිකර්මාන්තය, පරිසරය, ස්වභාවික සම්පත්, සෞඛ්‍ය, අධ්‍යාපනය, පර්යේෂණ සංවර්ධනය, වෙළඳ සහ මානුෂීය ආධාර ඇතුළු පුළුල් පරාසයක ඇ.ඩොලර් බිලියන 2 ඉක්මවන මුදලක සංවර්ධන ආධාර ලබාදී ඇති එක්සත් ජනපදය, ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංවර්ධන හවුල්කරුවකු වනවා. 2019 දී ශ්‍රී ලංකාව විසින් ඇ. ඩොලර් බිලියන 3.1ක අපනයන සිදුකළ එක්සත් ජනපද වෙළඳපල ශ්‍රී ලංකාවේ විශාලතම තනි අපනයන වෙළඳපල වනවා. මේ වසරේ මුල් අර්ධයේ ඇ.ඩො. බිලියන 1.1 ක මට්ටමක් පවත්වාගනිමින් වත්මන් කෝවිඩ්-19 තත්වය යටතේ පවා වෙළඳපල පිරිහීම සුළුවෙන් තමයි සිදුවී තිබෙන්නේ.

මිත්‍රයකු වශයෙන් එක්සත් ජනපදය ශ්‍රී ලංකාවට දුෂ්කර අවස්ථාවලදී සහය දී තිබෙන අතර ඔබේ එම සහය වෙනුවෙන් අප බෙහෙවින් ස්තුතිවන්ත වනවා. 2004 සුනාමි උවදුර අවස්ථාවේ එක්සත් ජනපදය ලබාදුන් සහ අතිවිශාලයි. හිටපු ජනපති (ජොෂ්ඨ) ජෝර්ජ් බුෂ් මහතා සහ හිටපු ජනපති බිල් ක්ලින්ටන් මහතාගේ පැමිණීමත්, එම අවස්ථාවේ අපට ලබාදුන් ආධාරත් මා මේ අවස්ථාවේ සිහිපත් කරනවා. ඒ වාගේම, මෑතකාලීනව 2019 අප්‍රේල් මාසයේදී පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාර එල්ල වූ අවස්ථාවේදීත්, වඩාත් මෑතකදී කෝවිඩ්-19 හි බලපෑම් අඩුකරගැනීමටත් අපට උපකාර කර තිබෙනවා. විශේෂයෙන්ම, 9/11 ප්‍රහාරවලටත් පෙර සිටම සහ මේ දක්වාම එල්ටීටීඊ ත්‍රස්තවාදී සංවිධානය තහනම් සංවිධානයක් ලෙස නම් කිරීම පිළිබඳව මාගේ හෘදයාංගම ස්තුතිය පල කරනවා.

ඒ අනුව ලේකම්තුමනි, අද අප නිරතවන මේ සාකච්ඡා, අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා එක්සත් ජනපද පාර්ශවයේ වැදගත් ධුර දරන්නන් සමගින් සිදුකළ සාකච්ඡා ද මා සමගින් පොම්පෙඕ ලේකම්තුමා මාස කිහිපයකට මත්තෙන් අන්තර්ජාලය හරහා සිදුකළ එම සාකච්ඡා ද  තවදුරටත් ඉදිරියට ගෙනයාමක් වනවා. එතුළින්, එකිනෙකා ප්‍රමුඛතාවය දෙන්නේ කුමක් සඳහා ද කියා අවබෝධ කරගැනීමටත්, තමන් පාර්ශවයේ අදහස් බෙදාහදාගැනීමටත්, එකඟ වූ සහයෝගිතා ක්ෂේත්‍රවල ද්වීපාර්ශවීය සම්බන්ධවීම් තවදුරටත් උසස් කරගැනීමටත් අවස්ථාවක් ලැබී තිබෙනවා.

අපගේ ද්වීපාර්ශවීය සම්බන්ධතා තවදුරටත් ශක්තිමත් කරගැනීමේ අරමුණින්, එක්සත් ජනපද - ශ්‍රී ලංකා හවුල්කාරීත්ව සංවාදයේ මීළඟ සැසිය 2021 මුල් කාලයේදී කැඳවීමටත් ආර්ථික, ආරක්ෂක හා පර්යේෂණ ඇතුළු අංශ ගණනාවකම වැඩි සම්බන්ධීකරණයක් හරහා ප්‍රගතිය සාක්ෂාත් කරගැනීමටත් අප එකඟ වූවා.

වෙළඳ හා ආයෝජන රාමු එකඟතාවයේ ඒකාබද්ධ සභාවෙහි මීළඟ සැසිය ද හැකිතාක් ඉක්මනින් පවත්වනවා ඇති. එමෙන්ම, තොරතුරු සන්නිවේදන තාක්ෂණය, සයිබර් අවකාශයේ ආරක්ෂාව, කෘෂිකර්මාන්තය, විද්‍යාව, තාක්ෂණය, නවෝත්පාදනය, වෙළඳ හා ආයෝජන ව්‍යාපාර සහ දේශගුණ විපර්යාස යනාදී ක්ෂේත්‍රවල අපගේ ද්වීපාර්ශවීය සබඳතා පුළුල් කරගැනීමටත් මෙය උචිත අවස්ථාවක් ලෙස සලකනු ලැබුවා.

ස්වෛරී, නිදහස් හා ස්වාධීන රටක් වශයෙන් ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය ඉදිරියටත් මධ්‍යස්ථ, නොබැඳි සහ මිත්‍ර ප්‍රතිපත්තිපත්තිය වනු ඇති. අපගේ රටේ උපායමාර්ගික පිහිටීම සමගින් ලැබී ඇති අවස්ථා සහ වගකීම් සිහියේ තබාගනිමින්, අපගේ මුහුදු සහ ගුවන් තල නිදහසේ තරණය කිරීමට ඇති හැකියාව පවත්වාගැනීමේ සහ මුහුදු සන්නිවේදන මාර්ග සහ මුහුදයට විදුලි පණිවිඩ රැහැන් ආරක්ෂා කරගැනීමේ වැදගත්කම අපට පෙනෙනවා.

සියළුම රටවල් සාගර නීතිය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය ඇතුළු ජාත්‍යන්තර නීතිය පිළිපැදිය යුතු සහ ඊට ගරු කළයුතු බව අප විශ්වාස කරනවා. ශ්‍රී ලංකාව සමගින් බහුවිධ නාවික සහයෝගීතා ඇතිකරගැනීමට ඇති හැකියාව සම්බන්ධයෙන් අපට පොදු අදහස් ඇති අතර ඒවා ඉදිරියට ගෙනයාමට උනන්දු වනවා. පොම්පෙඕ ලේකම්තුමාගේ සංචාරයත් සිදුකළ සාකච්ඡාත් මගින් අප අතරේ වූ උණුසුම් මිත්‍රශීලී සබඳතා තවදුරටත් වැඩි දියුණු වී තිබෙනවා. පොම්පෙඕ ලේකම්තුමනි, යළිත්වරක් මාගේ ස්තුතිය මා ඔබට පුදකරනවා.

අවසාන වශයෙන්, පොම්පෙඕ ලේකම්තුමාටත්, එතුමා සමගින් මේ සංචාරයට සම්බන්ධ වී සිටින පොම්පෙඕ මහත්මියටත් ශ්‍රී ලංකාවේ ඔබ ගතකරන කාලය ප්‍රසන්න වේවායි සහ ඔබ ඉදිරිදිනවල ආසියාවේ කරන සංචාර කටයුතු නිරුපද්‍රිත වේවායි ප්‍රාර්ථනා කරනවා.

**පොම්පෙඕ ලේකම්තුමා:** ස්තුතියි

**විදේශ අමාත්‍ය ගුණවර්ධන මහතා:** ශ්‍රී ලංකා ජනතාව වෙනුවෙන් මා ඔබට ආයුබෝවන් කියා සුභපතනවා.

**පොම්පෙඕ ලේකම්තුමා:** බොහෝම ස්තුතියි

**විදේශ අමාත්‍ය ගුණවර්ධන මහතා:** දැන් රාජ්‍ය ලේකම්තුමා ඔබ අමතනවා ඇති

**පොම්පෙඕ ලේකම්තුමා:** ස්තුතියි අමාත්‍යතුමනි.

**විදේශ අමාත්‍ය ගුණවර්ධන මහතා:** රාජ්‍ය ලේකම්තුමා.

**පොම්පෙඕ ලේකම්තුමා:** ස්තුතියි. ස්තුතියි අමාත්‍යතුමනි. සියළුදෙනාට ආයුබෝවන්. කොළඹ නගරයට පැමිණීමට ලැබීම ඉතා විශිෂ්ටයි. ඔබතුමා සඳහන් කළා වාගේම, අප සියළුදෙනාටම සුවිශේෂී සංවත්සරයක් වන, අප දෙරට අතර රාජතාන්ත්‍රික සබඳතා ඇතිකරගෙන 72වසරක් පිරෙන්නට පෙර දිනයේ, එසේ පැමිණීමට ලැබීමෙන් මේ ගමන තවත් සුවිශේෂී කරනවා.

විදේශ ඇමතිතුමාත් මාත් ඉතා අගනා සාකච්ඡාවක නිරත වූවා. නැවත පත්වීම සම්බන්ධයෙන් එතුමාට සුභ පතන්නට මට ඉඩ ලැබුනා- සුභ පැතුම් -ඒ වාගෙම, මීට මදක් පෙර, අද උදෑසන මට රාජපක්ෂ ජනාධිපතිතුමා සමගින් ඉතාමත් සාධනීය සාකච්ඡාවක නිරතවන්නට ලැබුනා.

මේ අවස්ථා දෙකෙහි දී ම, පොදුවේ මාගේ පණිවිඩය ඉතා පැහැදිලියි: ප්‍රජාතන්ත්‍රවාදී, සාමකාමී, සමෘද්ධිමත් සහ පූර්ණ වශයෙන් ස්වෛරී ශ්‍රී ලංකාවක් සමගින් අපගේ හවුල්කාරීත්වය ශක්තිමත් කරගැනීමට එක්සත් ජනපදය බලාපොරොත්තු වනවා. උදාහරණයක් වශයෙන්, අපේ නව තානාපති කාර්යාල ගොඩනැගිල්ල දැන් ඉදිකර අවසන් කරන්නට ආසන්නයි. එය, මෙරට සහ ශ්‍රී ලංකා ජනතාව කෙරෙහි අපේ ඇති කැපවීම පිළිබිඹු කරන සලකුණක්. ඒවාගේම, චීනයේ වූහාන් නගරයෙන් ආ වසංගතය පරාජය කිරීමට අප අතරේ ඇති සහයෝගීතාවය පිළිබඳව කථා කිරීමට අපි සැහෙන කාලවේලාවක් මිඩංගු කළා.

එක්සත් ජනපදය දැනට ඩොලර් මිලියන 6 ඉක්මවන ප්‍රමාණයක් කෝවිඩ් ආධාර වශයෙන් ශ්‍රී ලංකාවට ලබාදී තිබෙනවා. වසංගතය ආරම්භ වූ මුල් කාලයේදී ශ්‍රී ලංකාවේ කර්මාන්තශාලා සහ ඇඟළුම් නිෂ්පාදකයින් ඉහළ තත්ත්වයේ පුද්ගලාරක්ෂක උපකරණ කට්ටල සඳහා වූ සිය ගණනක ඇණවුම් සපුරාලනු ලැබුවා. ඇමරිකානු ජීවිත බේරාගැනීමට හේතු වූ මේ නිමැවුම් පිළිබඳව අප ස්තූතිවන්ත වනවා. බොහෝම ස්තූතියි.

මෙම වෛරසය පරාජය කර අපේ ජනතාවට මෙන්ම සමස්ථ ලෝකවාසී ජනතාවටම යහපත සැලසීම සඳහා එන්නත් හා චිකිත්සා සොයාගැනීමට ට්‍රම්ප් ජනාධිපතිතුමා පෞද්ගලික අංශය සමගින් එක්ව වෙහෙසෙනවා. මේ අවස්ථාවේ සහ අනාගතයේදී අපගේ ආර්ථිකය නැවතත් පෙර තිබූ තත්වයට ඔසවා තැබීම සඳහා අපට පෞද්ගලික කර්මාන්තවල බලය අවශ්‍ය වනවා, ඒ කාරණයේදී ශ්‍රී ලංකාවේ ජනතාව සමගින් එක්ව වැඩකිරීමට අප උනන්දුවෙන් සිටිනවා.

මේ සම්බන්ධයෙන් අපි සැහෙන තරමකට කථා කළා. අපගේ ආර්ථික සම්බන්ධතාවය, මේ වනවිට ලංකාවට පැමිණ තිබෙන අද්විතීය ඇමරිකානු සමාගම් පිළිබඳව අපි කථා කළා. Coke, Oracle සහ IBM වැනි සන්නාම මේ වනවිටත් මෙහි පැමිණ උසස් තත්වයේ රැකියා නිර්මාණය කරනවා. මේ ඇමරිකානු සමාගම්, ලෝකයේ වඩාත්ම විශ්වාසය තැබිය හැකි හවුල්කරුවන් වනවා. එම සමාගම් නීතියට වගවනවා, ඒවා විනිවිදභවයෙන් යුක්තයි, ඒවා ක්‍රියාත්මකවන ප්‍රජාවන්ට එම සමාගම් සම්පතක් වනවා.

ඒ වාගෙම, අද දින මා සඳහන් කළ පරිදි, යහපාලනය සහ ප්‍රතිපත්තිවල විනිවිදභාවය තුළින් නොකඩවා තව තවත් මෙවන් ඇමරිකානු ආයෝජන ආකර්ෂණය කරගැනීමට හැකිවේවි. එම මූලධර්ම ශ්‍රී ලංකාවේ ඉතිහාසය සහ ආසියාවේ පැරණිතම ප්‍රජාතන්ත්‍රවාදය වශයෙන් ශ්‍රී ලංකාවේ උරුමය සමගින් දැඩි සේ අනුකූලයි.

එමෙන්ම, අපගේ හවුල් අභ්‍යාසවලට අමතරව, අමාත්‍යතුමා සඳහන් කළා මෙන් ලෝකයේ වඩාත්ම වැදගත් ඇතැම් මුහුදු මාර්ග විවෘතව පවත්වාගෙන යාමට උපකාරී වන අපගේ ආරක්ෂක සහයෝගිතාවය සම්බන්ධයෙන් ද අප පුළුල් සාකච්ඡාවක් සිදුකළා. මාගේ ද විද්‍යාලය වන West Point වැනි එක්සත් ජනපද අධ්‍යයන ආයතනවලින් ශ්‍රී ලාංකික නිලධාරීන් පුහුණුව ලැබීම මට ආඩම්බරයක්. ඒවාගේම, ඔබේ මුහුදු තීරයේ ශ්‍රී ලංකා නාවික හමුදාව මුර සංචාරයේ යෙදෙන වෙරළාරක්ෂක නෞකා දෙකක් එක්සත් ජනපදයෙන් පරිත්‍යාග කර තිබීම පිළිබඳ මා ආඩම්බර වනවා.

සැබැවින්ම, ශක්තිමත් හා ස්වෛරී ශ්‍රී ලංකාවක් යනු, ලෝක වේදිකාව මත ඇමරිකාවට සිටින ප්‍රබල සහ ක්‍රමෝපායික හවුල්කරුවකු වනවා. එය, නිදහස් හා විවෘත ඉන්දු-ශාන්තිකරයක් සනිටුහන් කරන ආලෝක ස්ථම්භයක් වියහැකියි.

එය චීනය කරන්නට වෑයම් දරන දෙයට වඩා කොතරම් වෙනස් ද බලන්න. අහිතකර ගනුදෙනු, මුහුදේ හා ගොඩබිම සිදුකරන ස්වෛරීත්වය උල්ලංඝනය කිරීම් හා නොපනත්කම් හරහා අපට පෙනෙන්නේ චීන කොමියුනිස්ට් පක්ෂය ගොදුරු සඳහා මාන බලන විලෝපිකයකු බවයි. එක්සත් ජනපදය ක්‍රියාකරන්නේ ඊට වෙනස් අන්දමකින්. අපි එන්නේ මිතුරකු සහ හවුල්කරුවකු වශයෙනුයි.

අවසාන වශයෙන්, මේ සන්ධ්‍යාවේ දී මා යනවා- 2019 පාස්කු ඉරුදින ISIS සංවිධානයෙන් ප්‍රහාරයට ලක් වූ ස්ථාන පහෙන් එකක් වන ශාන්ත අන්තෝනි දේවස්ථානය වෙත යන්නට මොහොතක් වෙන් කිරීම මට වැදගත් කරුණක් වනවා. තව සුළු වේලාවකින්, ඇමරිකානු ජාතිකයින් පස් දෙනෙකු ද ඇතුළුව, දුෂ්ට ත්‍රස්තවාදීන්ගේ වින්දිතයින් බවට පත් වූ සියගණනක් පුද්ගලයින් වෙත මාගේ ගෞරවය දැක්වීමට අවස්ථාව

මට ලැබේවි. ශ්‍රී ලාංකිකයින්ට ඇමරිකානු ජාතිකයින් සහ තමන්ගේ රටේ වැසියන් ඝාතනය කළ එම වරදකරුවන් යුක්තිය ඉදිරියට පැමිණවීමට උපකාර කිරීම සඳහා රාජ්‍ය දෙපාර්තමේන්තුවෙන් සැලකියයුතු ප්‍රමාණයක ත්‍රස්ත විරෝධී ආධාර ලබාදෙන්නට ඉදිරිපත්වීම පිළිබඳව මා ආඩම්බර වනවා. මේ පාස්කු ඉරුදින ප්‍රහාරවලින් නියෝජනය වන්නේ ශ්‍රී ලාංකිකයින් සදාකාලිකවම අතහැර දැමීමට සූදානම් අන්දමේ නිකායවාදය යි. සියළු පසුබිම්වලින් එන ශ්‍රී ලාංකිකයින්- බෞද්ධයින්, හින්දුවරුන්, ක්‍රිස්තියානි බැතිමතුන් හා මුස්ලිම් බැතිමතුන් යන සියළුදෙනාට එකසේ- අවශ්‍ය වී ඇත්තේ තමන්ගේ මානව හිමිකම්වලට ගරුකරන සාමකාමී රටකුයි.

ගියවසරේ මැතිවරණ ජයග්‍රහණයෙන් පසු, තමන්ට පක්ෂව ඡන්දය ලබාදුන් අයගේ පමණක් නොව සියළුම පුරවැසියන්ගේ ජනාධිපතිවරයා තමන් වන බව රාජපක්ෂ ජනාධිපතිතුමා පවසා සිටියා. අප දෙරට ඉදිරියට ගමන් කරද්දී, එම වචනවල සත්‍යතාවය ආරක්ෂා කරනු ඇතැයි එක්සත් ජනපදය විශ්වාසය තබනවා. වගවීම, යුක්තිය සහ ප්‍රතිසන්ධානය ප්‍රවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් අර්ථවත් හා ශක්තිමත් පියවර ගන්නට ලබාදී ඇති පොරොන්දුව ඉටුකරනු ඇතැයි අපි බලාපොරොත්තු වනවා.

එනිසා, ඇමතිතුමනි අපි උරෙනුර ගැටෙන සේ සිටගනිමු. අප එසේ කරන කල්හි අපේ පුරවැසියන් වෙනුවෙන් සාක්ෂාත් කරගතහැකි යහපත් ප්‍රතිඵලවලින් ඇතැම් ඒවා අප දැක තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදී වටිනාකම්වලින් ඔප් නැංවුනු අපගේ හවුල්කාරීත්වයේ ශක්තියෙන් අපි එක්ව තවතවත් දේ කරමු.

මෙහි මට ලබාදුන් සත්කාරකත්වය වෙනුවෙන් ඔබට ස්තූතියි අමාත්‍යතුමනි.

**විදේශ අමාත්‍ය ගුණවර්ධන මහතා:** ස්තූතියි.

**රැස්වීම මෙහෙයවන්නා: දැන් අපි මාධ්‍ය සඳහා සභාව විවෘත කරනවා. මුලින්ම මෙරට මාධ්‍යවලින් ප්‍රශ්නය ඉදිරිපත් කරන මෙන් ඉල්ලා සිටිනවා.**

**ප්‍රශ්නය: මේ අවස්ථාව ලබාදීම පිළිබඳව බෙහෙවින් ස්තූතියි. මගේ නම ෂවිකා ගුණසේකර. මම ශ්‍රී ලංකාවේ (*නොපැහැදිලි ය*) ප්‍රවෘත්ති නියෝජනය කරනවා.**

මගේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ රාජ්‍ය ලේකම් පොම්පෙඕ මහතා වෙතයි. එක්සත් ජනපදය මැතිවරණයකට යන මේ අවස්ථාව ඔබතුමා ශ්‍රී ලංකාවේ සංචාරයක් සඳහා තෝරාගත්තේ ඇයි? ඔබතුමාගේ සංචාරයේ අරමුණ චීනයට එරෙහි සන්ධානයකට ශ්‍රී ලංකාව යොමුකරගැනීමද? මම අදහස් කරන්නේ, MCC, SOFA වැනි අළුත් ගිවිසුම් අත්සන් තැබීමෙන් හා Quad කණ්ඩායම හරහා ශ්‍රී ලංකාව තුළ බීජිං හි බලපෑම සමනය කරන්නට එක්සත් ජනපදය උත්සාහ කරනවාද?

ඒ වාගේම, අපගේ රටේ සිටිනා යුධ වීරයකු වන අපගේ වත්මන් හමුදාපතිතුමාට, ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතාට එරෙහිව, ස්වාධීනව තහවුරු නොකළ තොරතුරු මත පදනම්ව, ඔහුට එක්සත් ජනපදයට ඇතුළුවීමට තහනම් පනවා තිබෙනවා. මේ සම්බන්ධයෙන් වත්මන් තත්වය කුමක්ද? ජිනීවා යෝජනා සම්මතය අනුව ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා හට පනවා ඇති ගමන් තහනම පිළිබඳ නැවත සලකා බලන මෙන් ශ්‍රී ලංකා රජය ඔබෙන් ඉල්ලා තිබෙනවාද?

**පොම්පෙඕ ලේකම්තුමා:** හොඳයි, ස්තුතියි. මම හිතන්නේ එතන ප්‍රශ්න තුනක් තිබෙනවා. අවසාන ප්‍රශ්නය ගතහොත්, බලන්න, එය එක්සත් ජනපදයේ නීතිමය ක්‍රියාදාමයක්. අපි සැමවිටම එය සමාලෝචනය කරගෙන යාම සිදු කරනවා. එය තාක්ෂණික වශයෙනුත්, කරුණුමය වශයෙනුත්, නිතිමය වශයෙනුත් එය නිවැරදිව කිරීමටයි අපට අවශ්‍ය. අප නොකඩවා එය කරගෙන යනවා.

මා හිතන්නේ ඔබේ පළමු ප්‍රශ්නය කාල වකවානු සම්බන්ධ ප්‍රශ්නයක්. විදේශ ඇමතිතුමා මට මෙය මතක් කර දුන්නා. පෙර අවස්ථාවකදී මා මෙහි පැමිණෙන්නට නියම කරගෙන සිටියත් ලෝකය වටා සිදුවූ සිදුවීම් හේතුවෙන් ඒ අවස්ථාවේදී මට මෙහි පැමිණෙන්නට හැකි වූයේ නැහැ. මට පැමිණෙන්නට හැකි වූයේ මේ අවස්ථාවේදීයි. මා මෙහි පැමිණීම ගැන දැඩි සතුටකිනුයි සිටින්නේ. එය අද්විතීය අවස්ථාවක්, ඒ වාගේම, අපේ සම්බන්ධතාවල 72වැනි සංවත්සරය එළඹෙන අවස්ථාවේ මා මෙහි සිටීම වැදගත් යැයි මා සිතනවා. එසේ පැමිණෙන්නට හැකිවීම ගැන මට සතුටුයි.

ඔබේ අවසාන ප්‍රශ්නය අප මෙහි සාක්ෂාත් කරගන්නට වෑයම් දරන්නේ කුමක්ද යන්න පිළිබඳවයි. ශ්‍රී ලංකාවේ ජනතාවට ස්වෛරීත්වය හා ස්වාධීනත්වය ලැබීම අපට අවශ්‍යයි. ඔවුන් සාර්ථක වීම අපට අවශ්‍යයි. ඔවුන් වෙනුවෙන් තිරසාර සංවර්ධනය අපට අවශ්‍යයි. මිතුරකු සහ හවුල්කරුවකු වශයෙන් එක්සත් ජනපදය ලබාදීමට ඉදිරිපත්වන්නේ මේවා යැයි අප සිතනවා, අපට අවශ්‍යවන්නේ එයයි. බලන්න, අපට පොදු දැක්මක් තිබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදී රටවලට සෑමවිටකම එවැන්නක් තිබෙනවා, නේද? ඉතින් මා සංචාරය කරනවා- මා ඉන්දියාවට සංචාරය කළා, මා මෙහි ආවා, අද සැන්දෑවේ මා මාලදිවයින් කරා යනවා, ඉන්පසු ඉන්දුනීසියාවට යනවා. නිදහස් හා විවෘත නාවික ගමන්මාර්ග සඳහා, වෙළඳ ශක්‍යතාවය සඳහා, මිනිසුන්ට තමන් කැමති තැනක සැරිසැරීම සඳහා මේ සියළුම ප්‍රජාතන්ත්‍රවාදී රටවල්වලට පොදු දැක්මක් ඇති බව අප දන්නවා.

ශ්‍රී ලංකාවේ ජනතාව එක්සත් ජනපදයේ ජනතාව සමගින් බෙදාහදාගන්නා පොදු දැක්ම වන්නේ මේවායි. එනිසා, අද දින මාගේ මෙම සංචාරය එම කරුණු පිළිබඳව කථාබහ කිරීමටත් මෙරට ඇති අවස්ථාවන් දැක ඇමරිකානු පෞද්ගලික අංශයේ සමාගම් මෙරටට පැමිණ ආයෝජනය කර ශ්‍රී ලාංකිකයින් පුහුණු කර ඒ ප්‍රජාවන්ගේ සංවර්ධනයට දායක වන අන්දමින් අපගේ සම්බන්ධතාවය ඉදිරියටත් වර්ධනය කරගත හැකි ක්‍රම සොයාගැනීමටත් සිදුකරන ලද්දක්. ඇමරිකාව ලබාදීමට ඉදිරිපත්වන්නේ මෙවැනි දේවල්. එහි ඇත්තේ වෙනස් දැක්මක්. චීන පාර්ශවයට ඇත්තේ ඊට වඩා වෙනස් අන්දමේ දැක්මක්.

තවදුරටත් ස්වාධීනව සිටීම සඳහා තමන්ගේ ස්වෛරී අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේ හැකියාව පවත්වාගෙනයාමටත්, ඔබලා මෑතකදී පැවැත්වූවාක් මෙන් මැතිවරණ පැවැත්වීම සඳහා නිදහස පවත්වාගෙනයාමටත් ශ්‍රී ලංකාවේ ජනතාවට හැකිවන බව සහතික කරගැනීමට අපට අවශ්‍යයි. ප්‍රජාතන්ත්‍රවාදී රටවල් එක් වූ කල මෙවැනි දෑ සම්බන්ධයෙන් වැඩ කළ හැකියි. අප බෙදාහදාගන්නා දැක්ම වන්නේ මේවායි. අද දින මෙහි පැමිණීම සම්බන්ධයෙන් මා එතරම් සතුටු වන්නේ එනිසායි.

ස්තුතියි, ඉදිරිපත් කළ ඒ සියළු ප්‍රශ්නවලට ස්තුතියි.

**රූස්වීම මෙහෙයවන්නා:** හොඳයි, දැන් එක්සත් ජනපදයේ මාධ්‍ය වෙනුවෙන් අපි VOA හි නික් චිං වෙත යොමු වනවා.

**ප්‍රශ්නය: සුභ දවසක් විදේශ අමාත්‍යතුමනි, ඇත්තෙන්ම කොළඹ සුන්දර ස්ථානයක්, මෙහි පැමිණෙන්නට ලැබීම සතුටක්. මම අහන්න කැමතියි, මෙසේ එක්සත් ජනපදයේ රාජ්‍ය ලේකම්වරයකු ශ්‍රී ලංකාවට ආවේ වසර ගණනාවකට පසුයි. මෙම කළාපයේ එක්සත් ජනපදය සිටීම ඔබ පිළිගන්නවාද? (නොපැහැදිලි ය) එක්සත් ජනපද ශ්‍රී ලංකා සම්බන්ධතාවය චීනය සමගින් ශ්‍රී ලංකාවට ඇති සම්බන්ධයට කරදරකාරී වේද? ස්තුතියි.**

**විදේශ අමාත්‍ය ගුණවර්ධන මහතා:** මා කලින් සඳහන් කලාක් මෙන් එක්සත් ජනපද - ශ්‍රී ලංකා සම්බන්ධතාවය 72වැනි සංවත්සරයට එළඹී තිබෙනවා. අප රටට සංචාරය කිරීම සඳහා රාජ්‍ය ලේකම්තුමා විසින් එම සංවත්සරය තෝරාගෙන තිබීම ගැන අපට සතුටුයි. වසර දීර්ඝ ගණනාවක සහයෝගීතාවය තුළින් අප ඉදිරියට පැමිණ තිබෙනවා, අනාගතය කරා ද එලෙසම ගමන්කිරීමට අප බලාපොරොත්තුවෙන් පසුවනවා.

මේ අවස්ථාවේදී රාජ්‍ය ලේකම්තුමා අප සමගින් සිටිනවාක් මෙන් අනාගතයේදී ද බොහෝ එක්සත් ජනපද නියෝජිත නිලධාරීන් ශ්‍රී ලංකාවට පැමිණේවි. මා කලින් සඳහන් කලාක් මෙන් ශ්‍රී ලංකාව කියන්නේ සාමයට කැපවූ මධ්‍යස්ථ, නොබැඳි රටක්. ඒ මූලධර්ම මත පදනම් වෙමින් එක්සත් ජනපදය සහ අනෙකුත් රටවල් සමගින් අපගේ සම්බන්ධතා පවත්වාගෙන යන්නට අප බලාපොරොත්තු වනවා.

**පොම්පෙඕ ලේකම්තුමා:** හොඳයි, සියළුදෙනාට ස්තුතියි.